00673

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

විද්‍යාවේදී උපාධි පාඨමාලාව - 03 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2023/2024

LLU 3261/LWU1161 - නීතිය පිළිබඳ අවබෝධය

කාලය - පැය 02 යි

දිනය : 15.10.2023 වේලාව : පෙ.ව. 9.30 - පෙ.ව. 11.30

**සම්පූර්ණ ප්‍රශ්ණ ගණන - 06**

**ප්‍රශ්ණ 04 කට පමණක් පිළිතුරු සපයන්න.**

**අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.**

1. පහත නඩු විභාග කිරීම සඳහා නිසි අධිකරණ බලය සහිත අධිකරණය හඳුනාගන්න. ඔබේ පිළිතුර සඳහා හේතු සපයන්න.

(i) මහින්ද සහ නාලිනිට දරුවන් නොමැති අතර සයුරිව කුළවද්දා ගැනීම සඳහා ඔවුන් තීරණය කර ඇත.

(ii) X රාජ්‍යයෙහි ඇමතිවරියක ලෙස නිළියක පත් කර ඇත. ඇයට X සහ Y රාජ්‍යයන් දෙකෙහිම ද්විත්ව පුරවැසිභාවය පවතින බව අනාවරණය කර ගෙන ඇත.
අදාළ නිළියට මහජන නිළයක් දැරීමට ඇති අයිතිවාසිකම ප්‍රශ්ණ කිරීමට දැන් ඉසුරුට අවශ්‍යව ඇත.

(iii) ෆාතිමාගේ නිවසින් රු. 5000/- ක් වටිනා භාණ්ඩ සොරකම් කිරීම සම්බන්ධයෙන් සඳුන්ව අල්ලාගෙන ඇත.

(iv) නීලාට විරුද්ධව දික්කසාද නඩුවක් ගොනු කිරීමට සනත්ට අවශ්‍යව ඇත.

(v) රාජා පොළිස් භාරයට ගනු ලැබූ අතර එහිදී ඔහුට කෲර ලෙස පහර දෙන ලදී. පවුලේ සමාජිකයන්ටද ඔහුව බැලීමට ඉඩ නොදෙන ලදී. පසුව, පොළිසිය විසින් රාජා නියම වරදකරු නොවන බවත් ඔහුව අත්අඩංගුවට ගැනීම වැරදීමකින් වූ බවත් පවසා ඔහු නිදහස් කරන ලදී. රාජාගේ බිරිඳ පැමිණිලිකරන ලද්දේ රාජාගේ දකුණු අතෙහි සන්ධි විස්ථාපනය වීමක් සිදුව ඇති බවයි.

(ලකුණු 5 x 5 = 25)

2.

I. "ශ්‍රී ලංකාවේ පුද්ගල නීතීන් (Personals Laws) සහ ප්‍රාදේශීය නීතීන් (Territorial Laws) සමාන බවක් පෙන්නුම් කළද, ඒවා එකිනෙකට වෙනස් වේ." ඉහත ප්‍රකාශය උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

(ලකුණු - 15 )

II. ශ්‍රී ලංකාව තුළ තේසවලමෙයි නීතියෙහි යෙදීම සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර අදාළ නඩු තීන්දු අධාරයෙන් තහවුරු කළ යුතුය.

(ලකුණු - 10)

3. කම්කරු සහ විදේශීය සේවා නියුක්තිකයන් පිළිබද අමාත්‍යංශය මගින් සංවිධානය කරන ලද විශේෂ උත්සවයක ප්‍රධාන ආරාධිතයා ලෙස ඔබට ආරාධනා කර ඇති බව උපකල්පනය කරන්න. **"ශ්‍රී ලංකාවේ සේවක සුබසාධනය සම්බන්ධව පවත්නා නීති සහ සේවායෝජකයා විසින් සේවය අවසන් කළ විට පොදු නීතිය සහ ව්‍යවස්ථාපිත නීතිය යටතේ පවත්නා ප්‍රතිකර්ම."** සම්බන්ධයෙන් ඔබ විසින් දේශනයක් සිදු කිරීමට අවශ්‍යව ඇත.

ඔබේ දේශනය තුළදී ඔබ විසින් උගත් ව්‍යවස්ථාවන් 04 ක් වත් අවම වශයෙන් ඇතුළත් කළ යුතුය.

(ලකුණු - 25)

4.

I. පහත සඳහන් පද නිර්වචනය කරන්න.

(අ). සේවායෝජකයා

(ආ). සේවකයා (ලකුණු - 05)

II. කාර්මික ආරවුල් නිරාකරණය සඳහා 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනත මගින් සපයා ඇති විධිවිධානයන් මොනවාද?

(ලකුණු - 10)

III. "ග්‍රීන් ෆුඩ් ලංකා" සමාගමෙහි සේවකයන් සහ සේවායෝජකයන් අතර කාර්මික ආරවුලක් පැණ නැගී ඇත. තෙවන පාර්ශවයකගේ අවම මැදිහත්වීමකින් හා අවම පිරිවැයකින් ඔවුන්ගේ ආරවුල විසදා ගැනීමට ඔවුන්ට අවශ්‍යව ඇත. මේ සඳහා ඔවුන්ට පවත්නා වඩාත් හොඳම කාර්මික නිරවුල් ක්‍රමවේදය කුමක්ද? ඔබගේ පිළිතුර සාධාරණීකරණය කළ හැකි හේතූන් සමග සාකච්ඡා කරන්න.

(ලකුණු - 10)

5. රිශ්මා, "යූත් ස්පිරිට්" නම් වූ ප්‍රධාන වශයෙන්ම විලාසිතා සැලසුම්කරණයේ යෙදුණු සමාගමක හිමිකාරිය වේ. රිශ්මා නවීන පන්නයේ නව විලාසිතාවන් නිර්මාණය කරන ලද අතර පාරිභෝගිකයන් ආකර්ෂණය කරගනු පිණිස ඒවායේ ඡායාරූප සමාගම් වෙබ් අඩවියේ සහ සමාජ මාධ්‍යයන්හි පළ කරන ලදී. නව ඇඳුම් තොගය හඳුන්වාදීමට නියමිත ඕනෑම අවස්ථාවකදී රිශ්මා වෘත්තීය ඡායාරූප ශිල්පියෙකු වන ඉෂාරාගේ සහය ලබා ගත්තාය. ඇය විසින් ඡායාරූප ගැනීමක් සම්පූර්ණ කළ සෑම අවස්ථාවකදීම වැඩ කරන ලද පැය ගණන පදනම් කර ගෙන ඇය වෙත ගෙවීම් කිරීම රිශ්මා විසින් සිදු කරන ලදී. ඉෂාරා ඇගේම කැමරා සහ වෙනත් උපකරණ රැගෙන ආ අතර, ඡායාරූප ගැනීම් සිදු කරන අතරතුරේදී සමාගමෙහි නිළ ඇඳුම් ඇඳීම අවශ්‍ය විය. ඊට අමතරව, ඉෂාරා සතුව කුඩා ඡායාරූපාගාරයක් ඇගේ නිවසෙහි ස්ථාපිත කර තිබුණි.

රිශ්මා සමග පවතින ගිවිසුමෙහි ස්වභාවය සම්බන්ධයෙන් ඉෂාරා ඔබගෙන් නීතිමය උපදෙස් පතයි. අදාළ නීතිමය මූලධර්ම සහ පරීක්ෂණ ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු - 25)

6. පහත දැක්වෙන සංකල්ප / සිද්ධාන්ත අතරින් 05 ක් තෝරාගෙන ඒ සම්බන්ධව කෙටි සටහන් ලියන්න.

I. බලතල බෙදීමේ සිද්ධාන්තය
II. මූලික අයිතිවාසිකම් සම්බන්ධ සීමා කිරීම්
III. සේවා නියුක්ති වර්ග
IV. නීති මූලාශ්‍ර
V. නීතිය ක්‍රියාත්මක වීම මගින් ගිවිසුමක් අවසන් කිරීම
VI. 1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත යටතේ අභ්‍යන්තර වෙළඳ කොමසාරිස් සතු කාර්යයන්

(ලකුණු 5 x 5 = 25)

--------හිමිකම් ඇවිරිණි--------